අමීරේ අහ්ලුස්සුන්නත්, අබු බිලාල් හස්රත් අල්ලාමා මෞලානා
මුහම්මද් ඉල්යාස් අත්තාර් (කාදිරී, රZසවි)
(دامت برکاتہم العالیہ)
උර්දු භාෂාවෙන් රචිත ග්‍රන්ථයේ සිංහල පරිවර්තනය

# මෘතදේහයේ අසරණ භාවය

## HELPLESSNESS OF THE DECEASED

මෙම පොතේ
- මෘතදේහය පවසන්නේ කුමක්ද?
- රජුගේ (පාලකයාගේ) මරණය
- ජනාසා දැනුම්දීම
- T.V. බලා මරණයට පත්වීමෙන් දඬුවම්
- මුඩු හිස් නාගයා

යනාදිය දැක ගත හැකිය

උර්දු භාෂාවෙන් සම්පාදනය
අත්තාර් ගේ පුතණුවන්
හාජි අහ්මද් රZසා (අත්තාරි)

ෆයිසානේ මදීනා
නො. 10, මැසන්ජර් වීදිය, කොළඹ - 12
දුරකථනය : (011) 2394748/9
Email : maktaba@dawateislami.net
Website : www.dawateislami.net

අමීරේ අහ්ලුස්සුන්නත්, අබු බිලාල් හස්රත් අල්ලාමා මෞලානා
මුහම්මද් ඉල්යාස් අත්තාර් (කාදිරි, රzසවි)
(دامت برکاتہم العالیہ)

උර්දු භාෂාවෙන් රචිත ග්‍රන්ථයේ සිංහල පරිවර්තනය

# මෘත දේහයේ අසරණභාවය

සම්පාදනය
අත්තාර්ගේ පුතණුවන්
හාජි අහ්මද් උබෛද් රzසා අත්තාරී

ෆයිසානේ මදීනා
නො. 10, මැසන්ජර් වීදිය, කොළඹ - 12
දුරකථනය : (011) 2394748/9
Email : maktaba@dawateislami.net
Website : www.dawateislami.net

# පටුන


1. මෘත දේහයේ අසරණ භාවය ........ 3
2. සලවාතයේ මහිමය ........ 3
3. මෘත දේහය හා ගස්සාල් (නාවන්නා) ........ 3
4. මෘත දේහය පවසන්නේ කුමක්ද? ........ 4
5. මුළු ජීවිතයේම පිදූ මහන්සිය ........ 5
6. කබ්රයේ හිත සැලෙන කථාව ........ 6
7. රජුගේ (පාලකයාගේ) මරණය ........ 8
8. පාලකයා වෙලත් වැඩක් නැහැ ........ 9
9. ලොවට පැමිණීමේ අරමුණ ........ 10
10. ඇමතිකම් වලින්ද වැඩක් වන්නේ නැත ........ 10
11. නොකරන වාද 4 ක් ........ 12
12. ජනාසාවේ දැනුම් දීම ........ 15
13. කබ්ර් වාසීන් සමඟ සාකච්ජාවක් ........ 16
14. රූපවාහිනී යන්ත්‍ර (Televison) තබා යෑමෙන් මැරුණු කෙනාට කබ්රයේ අසාබ් (දඬුවම්) ........ 17
15. රූපවාහිනී යන්ත්‍ර (Televison) ඉවත් කිරීමෙන් නබි නායක صَلَّى اللّٰهُ تَعَالٰى عَلَيْهِ وَاٰلِهٖ وَسَلَّم ගෙන් සුභ පැතුම් ........ 19
16. කපටිකම් හා රැවටීම් නොකරන්න ........ 19
17. භයංකර ප්‍රපාතය ........ 21
18. මුඩු හිස (පැතලි ඔලු) නාග රාජයා ........ 21
19. දවස් 40ක් වන තෙක් සලායතයන් පිළි නොගැනේ ........ 22
20. ෂේරේ හුදා (දෙවියන්ගේ සිංහයා) තුමානන්ගේ මත් පැන් පිළිකුල ........ 23
21. දුෂ්ට දෙමව්පියන්ටත් අවනත වීම ........ 23
22. පොරොන්දු කඩ කරන්නාගේ විනාශය ........ 24
23. උදරයේ පණුවන් ........ 25
24. 3වෙරක් 'සිනා කිරීමටත් වඩා අන්තයි ........ 26
25. නිරයේ තෝෂා (උදේ ආහාරයක්) ........ 26
26. මදනි උසුල් (නීති රීති) හත ........ 26

اَلْحَمْدُ لِلّٰهِ رَبِّ الْعٰلَمِيْنَ وَالصَّلٰوةُ وَالسَّلَامُ عَلٰى سَيِّدِ الْمُرْسَلِيْنَ
اَمَّا بَعْدُ فَاَعُوْذُ بِاللّٰهِ مِنَ الشَّيْطٰنِ الرَّجِيْمِ ط بِسْمِ اللّٰهِ الرَّحْمٰنِ الرَّحِيْمِ ط

## 1. මෘත දේහයේ අසරණ භාවය

ෂෙතාන් ඔබ මේ පිටු 32 සමන්විත පොත් පිංච කියවීම නතර කිරීමට කොපමණ වෙහෙසක් දැරුවත් ඔබ මෙය මුළුමනින්ම කියවන්න. ඉන්ෂා අල්ලාහ් عَزَّوَجَلَّ ඔබ ඔබේ සිතේ මදනි ඉන්කිලාබ් (මදනි විප්ලවයක්) සිදු වන බව දැන ගත හැක.

## 2. සලවාතයේ මහිමය

අතිගරු වූ ද ආලෝකයේ මැවීම් වූ ද කියාමත්දිනයේ දී ෂෆාඅත් කරගන්නා වූ ද රෝෂනී වදන් කියන්නා වූ ද නූරුන්අලා නූර්වුද අප නබි නායක صَلَّى اللّٰهُ تَعَالٰى عَلَيْهِ وَاٰلِهٖ وَسَلَّم තුමාණන් මෙසේ පැවසූහ. යම් කිසි කෙනෙක් සලවාතය සමග තමන්ගේ සභාව ආරම්භ කරත් ද එම සලවාතය කියාමත් දිනයේ ඔහු වෙනුවෙන් නූර් (ආලෝකය) වන්නේය. (ෆිර්දව්සිල් අඃබාර් හදීස් නොː 3148 2වැනි කොටස 417 වැනි පිටුව දාරුල්කුතුබුල් ඉල්මියා බේරුත්)

صَلُّوا عَلَى الْحَبِيْب!　　　صَلَّى اللّٰهُ تَعَالٰى عَلٰى مُحَمَّد

## 3. මෘත දේහය හා ගස්සාල් (නාවන්නා)

බටහිර ප්‍රසිද්ධ ආලිම්, මුහද්දිස් හා තාබීර් වරයෙකු වන හසරත් සෛයිදුනා සුෆ්යානුස්සව්රි رَضِىَ اللّٰهُ تَعَالٰى عَنْه

පවසන්නේ මරණයට පත් පුද්ගලයා හැම දෙයක්ම දනියි. ඔහු ගස්සාල් (නාවන්නාට) මෙසේ පවසයි. ඔබට අල්ලාහ්ගේ عَزَّ وَجَلَّ නාමයෙන් දිවුරමි. නාවන විට මා ගෙන ප්‍රවේසම් වෙන්න. එසේම දේහය (මයියතය) ඇඳේ තිබෙන විට එම මයියතයට මෙසේ පවසනු ලැබේ. ඔබ ගැන මිනිසුන් කරන කතා අසන්න. (ෂර්හුසුදූර් පිටුව 95 දාරුල් කුතුබුල්ඉල්මියා බේරුත්)

## 4. මෘත දේහය පවසන්නේ කුමක්ද?

අමීරුල්මුඃමිනීන් හසරත් සෛයිදුනා උමර් ඒ ෆාරුක් رَضِیَ اللہُ تَعَالٰی عَنہ විසින් රිවායතයක් නම් නබියේ කිරීම්, රවුෆූර් රහීම් صَلَّی اللہُ تَعَالٰی عَلَیہِ وَاٰلِہٖ وَسَلَّم තුමාණන් මෙසේ පැවසූහ. ජනාසාව (මෘත දේහය) සුන්දුක් (මිනී පෙට්ටිය) මත තබා එය ගෙන අඩි තුනක් යන විටම එය කතා කරයි. එම (මෘත දේහයේ) කථාව මිනිසුන් හා ජින්වරුන් හැර අන් සියළු සත්වයන්ට ඇසෙනු ලැබේ. එම දේහය පවසන්නේ මාගේ සහෝදරවරුණි, තවද මාගේ ජනාසාව රැගෙන යන්නී! මේ ලෝකය මාව රැවැට්ටූ ආකාරයට ඔබව ද රැවටිය හැක. තවද කාලය මා සමඟ සෙල්ලම් කල ආකාරයටම ඔබ සමඟ ද සෙල්ලම් කරයි. මා උපයපු සියල්ල පරම්පරාව (උරුමක්කාරයන්) වෙනුවෙන් කැප කළෙමි. අල්ලාහ් عَزَّ وَجَلَّ කියාමත් දිනයේ මගෙන් හිසාබ් (ප්‍රශ්ණ) කරයි. මට දඬුවම් දෙයි. එය එසේ සිදු වන විට ඔබලා මගෙන් සමුගන්න අතර මා වෙනුවෙන් වැළපෙනවා ද ඇත. (ෂර්හසුදූර් පිටුව 96 දාරුල්කුත්බුල් ඉල්මියා බේරුත්)

"ලෝකය දිනූ සිකන්දරු යන විටත් මෙලොවින් ගියේ හිස් අතිනි."

## 5. මුළු ජීවිතයේම පිදූ මහන්සිය

මා හිතාදරණීය මුස්ලිම් සහෝදරවරුණි! ශරීරයෙන් රූහ් (ප්‍රාණය) ඈත් වූ විට කෙසේ අසරණ තත්වයක් උදා වේද? වටිනා ඇඳුම් පැළඳුම් සියල්ල ගලවන විට ඇති වන අසරණ බව (කරකියා ගත නොහැකි තත්වය) කාට කියන්නද? ගස්සාල් (නාවන්නා) නාවයි. කෆන්අන්දවනු ලැබෙයි. ජනාසාව (මෘත දේහය) පිටත් කරන විට ඇති වන ශෝකය කෙසේද? නැවත, නැවත ජීවිතය පුරාම කළ උත්සහය, රෑ මුළුල්ලේ නිදිමරා ගෙන හැම ප්‍රශ්නයකටම මුහුණ දී සතුරන් අඩපන කිරීමට උත්සාහ කළත් ජීවිතය පරදුවට තබා හම්බ කළ වස්තූන් එකතු කළ දේපල පිළිසකර කළ ගෙවල් එහි විවිධ මාදිලියේ ගෘහ භාණ්ඩ වලින් අලංකාරවත් කා වෙනුවෙන්ද? මේ සියල්ල අත හැර සමුගන්න සිදු වේ. අධි මිළැති ඇඳුම් තිබූ තැන්වලම තිබේ යාන වාහන තිබුණත් ඒවා ගරාජයේ නවතා තිබේ. සෙල්ලම් බඩු, සුඛෝපබෝගී ලෙස පාවිච්චි කළ දේ එහෙ මෙහේ විසිරී ඇත. ආලෝකයෙන් දිලිසෙමින් තාවකාලිකව සතුටින් සිනා වී ලෝකයට පෙන්වමින් තිබූ අස්ථිර ගෙයින් රැගෙන අඳුරු කබ්රය (සොහොන) ට උරහිසේ තබා ගෙන කබ්රස්ථානයට (සොහොන්භූමියට) ගෙන යන මෘත දේහයේ අසරන භාවය කාට කියන්නද?

# 6. කබ්රයේ හිත සැලෙන කථාව

හසරත් සෙයිදුනා උමරිබ්නු අබ්දුල් අසීස් رضی اللہ تعالیٰ عنہ එක් ජනාසාවක් සමග කබ්රස්ථානයට (සොහොන්භූමියට) ගියහ. එහි කබ්රයක් ළඟ වාඩි වී කල්පනා කරමින් සිටියදී කෙනෙක් මෙසේ ඇසූහ. "යා අමීරුල් මුංමිනීන්! ඔබ තුමාණන් තනියෙන් මෙහි සිටින්නේ කෙසේද?" එවිට එතුමා පැවසුවේ "දැන් එක් කබ්රයක් මට අඬගසා (කථා කර) මෙසේ පැවසුවා. ඒ උමරිබ්නු අබ්දුල් අසීස්! කබ්රය තුළට පැමිණෙන්නන් හට මා කුමක් කරන්නේද? මාගෙන් නොවිමසන්නේ ඇයි? එවිට මා "අනිවාර්යයෙන් පවසන්න" එවිට කබ්රයට පැමිණෙන්නන්ගේ කෆන් ඉරා දමමි, ශරීරය කැබලි කර එය කා දමමි. ඇයි ඔබ මාගෙන් නොවිමසන්නේ මා ඔවුන්ගේ අවයවයන් වලට කුමක් කරන්නේ ද කියා." එවිට මා පැවසුවෙමි "අනිවාර්යයෙන් පවසන්න" එවිට "අත් පා මැණික් කටුවෙන්ද වළලුකර වලින් ද කකුල් වලින් ද වෙන් කරන්නෙමි." මෙය පැවසීමෙන් පසු හසරත් සෙයිදුනා උමරිබ්නු අබ්දුල් අසීස් رضی اللہ تعالیٰ عنہ ඉකිබිඳිමින් ඇඬූහ. ටික වේලාවකින් නැවතත් එසේ භයංකාරත්වයේ අවවාද අනුශාසනා කියන්නට විය. ඉස්ලාමීය සහෝදරවරුණි! මෙලොවෙහි අපි ජීවත් වන්නේ ටික කාලයයි. මේ ලෝකයේ මහා බල සම්පන්න උසස් තැන්වල සිටි තැනැත්තන් කියාමත් (අවසාන දිනයේදී) ඉතාමත් පහත් අය බවට පත් වන්නේය. කව්රුන් මේ ලෝකයේ මහා ධනවතාද? කියාමත් (අවසාන දිනයේ දී) ෆකීර් (හිඟන්නන්) බවට

පත් වන්නෝය. ඔවුන්ගේ තරුණ කම වයසට යයි. තවද ජීවතුන් අතර සිටින්නන් මරණයට පත් වෙයි. ලෝකය ඔබ අතරට පැමිණ ඔබව රැවටිය හැක. මක්නිසාද යත් මෙය ඉතා ඉක්මනින් වෙන් වන්නේය. කුර්ආනය පරායනය කරන්නන් කොහේ ගියාද? රමලාන් මාසයේ උපවාසය රකින්නන් කොහේ ගියාද? පස් ඔවුන්ගේ ශරීරයන්ට කුමක් කළාද? ඔවුන්ගේ ඇටකටු වලට වුනේ කුමක්ද? අල්ලාහ් عَزَّ وَجَلَّ ගේ නාමයෙන් දිවුරමි, මෙලොවෙහි සුව පහසු සිනිඳු ඇඳන්වල සිටි ඔවුන් තම නෑදෑයන් අඹුදරුවන් සියල්ල අතහැර දැන් දුක් විඳිති. ඔහුගේ වැන්දඹු බිරිඳ දෙවන කසාද කර ගෙන ජීවත් වෙයි. ඔහුගේ දරුවන් මහපාරට වැටී දුක් විඳියි. ඔහුගේ නෑදෑයන් ඔහුගේ ගෙය හා වස්තුන් වෙන් කර බෙදා ගනිති. අල්ලාහ් عَزَّ وَجَلَّ ගේ නාමයෙන් දිවුරමි ඔවුන්ගෙන් භාග්‍යවන්තයන් ද සිටිති. මරණයට පසු කබ්රයේ සැප විඳිති. තවද අල්ලාහ්ගේ නාමයෙන් දිවුරමි සමහරුන් කබ්රයේ දඬුවමට ලක් වී සිටිති.

කණගාටුයි සහෝදරවරුණි! මැරුණු වෙලාවම සමහර විට තම පියාගේ, තම පුතාගේ, නැත්නම් තම සහෝදරයාගේ ඇස් වසයි. එයින් කෙනෙකු නාවයි, තව කෙනෙකුට කෆන් අන්දවයි, තව කෙනෙකුගේ ජනාසාව රැගෙන යයි. කෙනෙකුව වළ දමා භූමදානය කරයි. අනිවාර්යයෙන්ම හෙට මේ සියල්ල ඔබ සමඟත් සිදුවෙයි. "මට දැනගන්න තිබේ නම් මාගේ කුමන කම්මුලද පළමුවෙන්ම නරක් වන්නේ කියා" යැයි පැවසූ හසරත් සෙයිදුනා උමර්ඉබ්නු අබ්දුල් අසීස් رضى الله تعالى عنه ඇඬූහ. නොනවත්වා ඇඬීම හේතුවෙන් සිහි නැති විය.

සතියකට පසු එතුමාණන් ද මෙලොවින් සමුගත්හ.

(අල් රවුලුල් ෆාඉක් පිටුව 138 දාරුල්කුතුබුල්ඉල්මියා බෙරූත්)

හුජ්ජතුල් ඉස්ලාම් හසරත් සෙයිදුනා ඉමාම් මුහම්මද් ගස්සාලි علیہ رحمۃ اللہ الوالی ඉහ්යාඋල් උලූම් ග්‍රන්ථයේ පවසන්නේ වෆාත් වන අවස්ථාවේ හසරත් සෙයිදුනා උමර්ඉබ්නු අබ්දුල් අසීස් رضی اللہ تعالٰی عنہ තුමාණන්ගේ මුවෙන් මෙම කුර්ආන් ආයතය පිට වෙමින් තිබුණි.

تِلْكَ الدَّارُ الْاٰخِرَةُ نَجْعَلُهَا لِلَّذِيْنَ لَا يُرِيْدُوْنَ عُلُوًّا فِى الْاَرْضِ وَلَا فَسَادًا ؕ وَالْعَاقِبَةُ لِلْمُتَّقِيْنَ ۝

(پ۲۰، القصص ۸۳)

**තර්ජීමා කන්සුල් ඊමාන්:-** එලොව කියාමත් දිනයේ මෙළොවේ අහංකාරයට අකැමැති වූවන්, කෝලාහල වලට අකැමැති වූවන් වෙනුවෙන් ගෙවල් වෙන් කර ඇත. තවද හොඳ තීරණයන් භක්තිවන්තයන්ටමයි. (ජු:20 අල්කසස් 83)

(ඉහ්යාවුල් උලූම් 48 වැනි කොටස පිටුව 510 දාරුල්කුතුබුල් ඉල්මියා බෙරූත්)

## 7. රජුගේ (පාලකයාගේ) මරණය

මාගේ හිතාදර ඉස්ලාමීය සහෝදරවරුණි! හසරත් සෙයිදුනා උමර් ඉබ්නු අබ්දුල් අසීස් رضی اللہ تعالٰی عنہ ගේ මෙම වාක්‍ය ඥානවන්තයන් (උගතුන්) ට හොඳ පාඩමක් වන්නේය. තවත් පාලකයෙකුගේ මරණය ගැන වාක්‍යක් මෙසේය. එනම් හුජ්ජුතුල් ඉස්ලාම් හසරත් සෙයිදුනා

ඉමාම් මුහම්මද් ගස්සාලි عليه رحمة الله الوالی ඉහ්යා උලූම් නැමති ග්‍රන්ථයේ පවසන්නේ සකරාතයේ (මරණ මංජකයේ) කෙනෙක් කලීෆා අබ්දුල් මාලික් මර්වාන්ගෙන් මේ වෙලාවේ ඔබ තුමාට දැනෙන්නේ කෙසේ දැයි විමසීය. එවිට ඔහු මෙසේ පිළිතුරු දුන්නේය. හරියට කුර්ආන් මජීදයේ හත්වන ජූසයේ අන්ආම් වල 95 වැනි ආයතයේ අල්ලාහ්ගේ කියමනා වාගෙයි.

وَلَقَدْ جِئْتُمُونَا فُرَادٰى كَمَا خَلَقْنٰكُمْ اَوَّلَ مَرَّةٍ وَّتَرَكْتُمْ مَّا خَوَّلْنٰكُمْ وَرَآءَ ظُهُوْرِكُمْ (پ۷، الانعام ۹۴)

**තර්ජිමා කන්සුල් ඊමාන්:-** තවද ඇත්තටම ඔබ අපි ළඟට තනියෙන් පැමිණියේ හරියට අපි ඔබ පළමු වතාවට මැව්වා (නිර්මාණය කළා) වගෙයි. තවද ලෝකයේ අත හැර පැමිනි මිල මුදල් සියල්ල ලබා දුන්නේ අපයි. (ජුස්උ:7 අන්ආම්95) (ඉහ්යාඋල් උලූම් 4වැනි පිටුව 810 දාරුල් කුතුබුල් ඉල්මියා බේරුත්)

## 8. පාලකයා වෙලත් වැඩක් නැහැ

හුජ්ජතුල් ඉස්ලාම් හස්රත් සෛයිදුනා ඉමාම් මුහම්මද් ගස්සාලි ඉහ්යාඋල් උලූම් නැමති ග්‍රන්ථයේ මෙසේ පවසති. ප්‍රසිද්ධ කලීෆා හාරූන් රෂීද් رحمة الله تعالىٰ عليه තුමාණන්ට තමන්ගේ අවසාන වේලාව ළඟවන විට ඔහු තමන්ගේ කෆන් (මෘත දේහය ඔතන සුදු රෙදි) අතට ගෙන පෙරළා කණගාටුවෙන් අල්කුර්ආනයේ 29 වැනි ජුසයේ අල් හාක්කතු සුතරයේ මෙම ආයතය උසුරන්නට විය.

**තර්ජිමා කන්සුල් ඊමාන්:-** මාගේ මිල මුදල් කිසිම වැඩකට ප්‍රයෝජනවත් වූයේ නැත. මාගේ බලසම්පන්න භාවයත් නැති වී ගියා. (ජ:29 අල් හාක්කා28,29) (ඉන්යාඋල් උලූම් 4වැනි කොටස පිටුව 511 දාරුල් කුතුබුල් ඉල්මියා බේරුත්)

مَـا اَغْـنٰـى عَنِّیْ مَالِیَـهْ ۚ هَـلَکَ عَنِّیْ سُلْطٰنِیَـهْ ۚ (پ۲۹،الحآقہ،۲۸،۲۹)

## 9. ලොවට පැමිණීමේ අරමුණ

මාගේ හිතාදර ඉස්ලාමීය සහෝදරවරුණි! සත්‍ය කුමක්ද යත් අප සියළු දෙනාම මෙලොවට පැමිණ පරීක්ෂණයකට ලක් වී ඇත. අප මෙලොවට පැමිණීමේ අරමුණ එකක් වුවත් අප එය පසෙක තබා වෙනත් අරමුණු ගැන සිතා ගෙන සිටින්නෙමු. අප ජීවිතය තුළින් සිතා සිටින්නේ නොමැරෙන බවයි. මතක තබා ගන්න! අප මෙහි ස්ථිරව සිටින්නේ නැත. මෙලොවට පැමිණීමේ අරමුණ මුදල් හම්බ කිරීම පමණක් නොවේ. මේ ලෝකයේ ඉගෙන ගෙන සහතිකයන් එකතු කිරීමට හා ලෝකයේ උසස් වීම් ලැබීමට පමණක් නොවේ. කුර්ආනය පවසන්නේ

**තර්ජිමා කන්සුල් ඊමාන්:-** ඔබ සිතන්නේද අපි ඔබව ප්‍රයෝජනයකින් තොරව මැව්වා කියා. තවද ඔබ අපි ළඟට නැවත එන්නේ නැන්ද? (ජු : 18 අල්මුංමීනුන් 115)

اَفَحَسِبْتُمْ اَنَّمَا خَلَقْنٰکُمْ عَبَثًا وَّاَنَّـکُـمْ اِلَیْنَـا لَا تُرْجَعُوْنَ ○ (پ۱۸،المؤمنون،۱۱۵)

## 10. ඇමතිකම් වලින්ද වැඩක් වන්නේ නැත

සත්‍ය වශයෙන් ම අල්ලාහ් තආලා මිනිසාව

තමන්ගේ ඉබාදත් (නැමදීමට) සඳහාම මැවීය. එහි තමන්ගේ ජීවිතයේ අරමුණ වැරදුනහොත් කියාමත් දිනයේ අකුසල් (පව්) සියල්ල පොදි බැඳ රැගෙන අල්ලාහ් عَزَّ وَجَلَّ ඉදිරියට පමුණු වන විට ලෝකයේ රැස් කළ අති මහත් මුදල් කන්දරාවටවත් අල්ලාහ් عَزَّ وَجَلَّ ගේ කෝපයෙන් මුදවා ගැනීමට නොහැකිය. මොලොව ඥානය, ඉගැනීම, කර්මාන්තශාලා, ආයුධ, තනතුරු, ඇමතිකම් මේ සියල්ලම අල්ලාහ් عَزَّ وَجَلَّ ගේ ඉදිරියේ දී ගරුත්වයක් ලබා දිය නොහැක.

මෙය පදවි තන්හාවෙන් එකිනෙකාගේ රහස් පිටකරන්නන්, ත්‍රස්තවාදයට උදව් දෙන්නන්, තවද මුස්ලිම් වරුන්ගේ අයිතීන් නැති කරන්නන් සිතිය යුතු දෙයකි. එසේ නැතහොත් අල්ලාහ් عَزَّ وَجَلَّ ගේ කෝපයට භාජනය විය හැක. එසේම ඔහුගේ රසූල් صَلَّى اللّٰهُ تَعَالٰى عَلَيْهِ وَاٰلِهٖ وَسَلَّم තුමානන් කෝප වී ඊමානය නැති වුවහොත් ඇති වන උවදුර නම් කවදාවත් නතර කළ නොහැක.

අල් කුර්ආනයේ සූරා හුමාසාවල 30 ජුසයේ මෙසේ පවසයි.

**තර්ජිමා කන්සුල් ඊමාන්:-** මහා කාරුණික පරම දයාබර අල්ලාහ්ගේ නාමයෙන් ආරම්භ කරමි. මිනිසුන් ඉදිරියේ දොස් කියන, පිටුපස කේලම් කියන්නාට අපලයි. කවුරුන් මෙම ලෝකයේ මිල මුදල් එකතු කර ගණන් බලමින්,

بِسۡمِ اللّٰہِ الرَّحۡمٰنِ الرَّحِیۡمِ ○
وَیۡلٌ لِّکُلِّ ہُمَزَۃٍ لُّمَزَۃِ ○ الَّذِیۡ جَمَعَ مَالًا وَّعَدَّدَہٗ ○ یَحۡسَبُ اَنَّ مَالَہٗۤ اَخۡلَدَہٗ ○ کَلَّا لَیُنۡبَذَنَّ فِی الۡحُطَمَۃِ ○ وَمَاۤ اَدۡرٰکَ مَا الۡحُطَمَۃُ ○ نَارُ اللّٰہِ الۡمُوۡقَدَۃُ ○ الَّتِیۡ تَطَّلِعُ عَلَی الۡاَفۡـِٕدَۃِ ○ اِنَّہَا عَلَیۡہِمۡ مُّؤۡصَدَۃٌ ○ فِیۡ عَمَدٍ مُّمَدَّدَۃٍ ○ (پ۳۰، ہمزہ)

ප්‍රවේසමෙන් ඒවා ආරක්ෂා කරමින් මෙම මුදල් ලෝකයේ මා සදාකල් තබා ගනීදැයි සිතන්නේද? එසේ කවදාවත් නැත. "හුදමා" නැමති නිරයේ දමනු ලැබේ. නුඹ දන්නේ කුමක්ද? එහි අල්ලාහ්ගේ ගිණි ඇවිලෙයි. එය ඔවුන්ගේ හදවත් තුළට නගියි. ඔවුන් නරකාදියේ ඇති කණුවල බැඳ එහි දොරවල් වසනු ලැබේ.

## 11. නොකරන වාද 4 ක්

හසරත් සෙයිදුනා ෂාකීක් බල්හි عليه رحمة الله القوی තුමාණන් මෙසේ පැවසූහ. මිනිසුන් පිටතින් කරුණු 4කට පොරොන්දු වෙති. නමුත් ඔවුන්ගේ අභ්‍යන්තර හැසිරීම එයට පටහැනිය.

1. ඔවුන් තම මුවෙන් ප්‍රකාශ කරන්නේ අපි අල්ලාහ් عَزَّ وَجَلَّ ගේ යටත් වැසියන්ය. නමුත් ඔවුන්ගේ අභ්‍යන්තර හැසිරීම නිදහස්ය.
2. ඔවුන් පවසන්නේ අල්ලාහ් عَزَّ وَجَلَّ ආහාර සපයන්නාය. නමුත් ඔවුන් වැඩි වැඩියෙන් මිළ මුදල් එකතු කිරීමෙන් පසුත් සෑහීමකට පත් නොවෙති.
3. ඔවුන් පවසන්නේ මෙලොවට වඩා එලොව උතුම්ය. නමුත් ඔවුන් මෙලොව යහපතටම සැරසෙති.
4. ඔවුන් පවසන්නේ අප සියල්ලට එක් දිනක අනිවාර්යයෙන්ම මැරෙන්න සිදු වෙයි. නමුත් ඔවුන්ගේ ජීවිතය දෙස බැලුවහොත් අමරණීය ජීවිතයක් ගත කරන ලෙස සිතා ජීවත් වෙති.

## පළමු වාදය මම අල්ලාහ් عَزَّ وَجَلَّ ගේ යටත් වැසියා වෙමි.

මාගේ හිතාදර ඉස්ලාමීය සහෝදරවරුණි! සත්‍ය වශයෙන්ම අපි සිතිය යුතුයි සියළුම මුස්ලිම්වරු තමා අල්ලාහ් عَزَّ وَجَلَّ ගේ යටත් වැසියා බව පිළිගත යුතුයි. නමුත් අද සිටින මුස්ලිම්වරු වැඩි දෙනෙක් තමන් නිදහස් යැයි සිතති. නමුත් එහි නීතියක් ඇති බව අමතක කරති. බලන්න, කෙනෙක් තවත් කෙනෙකුට සේවය කරන විට හාම්පුතාට අවශ්‍ය පරිදි (එනම් හාම්පුතාට) සේවය කළ යුතුයි. ඇත්ත වශයෙන්ම අපි අල්ලාහ් عَزَّ وَجَلَّ ගේ යටත් වැසියන්ය. ඔහු දෙන ආහාර අනුභව කරන්නෙමු. නමුත් කනගාටුයි. අප ළඟ නියම යටත් වැසි භාවයක් නැත. ඔහු කුසලානය ඉටු කරන ලෙස අණ කරයි. එයත් මගහරින්නෙමු. රාමළානයේ උපවාසය රකින ලෙස අණ කරයි. අපි එයත් පිළිපදින්නේ නැත. ඒ වාගේ අනෙකුත් අල්ලාහ්ගේ අණද නිසියාකාරව පිළිපදින්නේ නැත.

## දෙවන වාදය අල්ලාහ් عَزَّ وَجَلَّ ආහාර දෙන්නාය

ඇත්ත වශයෙන්ම අල්ලාහ් عَزَّ وَجَلَّ තආලා අපහට ආහාර ලබා දීමේ වගකීම භාරගෙන ඇත. නමුත් රිස්ක් (ආහාර) ලබා ගැනීමට ඇති ආකාරයන් පුදුම සහගතයි. අල්ලාහ් عَزَّ وَجَلَّ ට රස්සාක් (ආහාර පාන දෙන්නා) යැයි පිළිගන්නා අතරම මිනිසුන් පොළී ගන්නේ ඇයි? පොළියට ණය අරන් කර්මාන්ත ශාලාවන් හදා ගෙවල් දොරවල් ද හදති. අල්ලාහ් عَزَّ وَجَلَّ ව රස්සාක් (ආහාර පාන දෙන්නා) යැයි විශ්වාස කිරීමෙන් පසු අල්ලස්

ගැනීමට ඇති අවශ්‍යතාවය කුමක්ද? බඩු කලවම් කර විකිණීමට ඇති අවශ්‍යතාවය කුමක්ද? ඇයි හොරකම් පැහැර ගැනීම් අවශ්‍ය වන්නේ? ආහාර ලබා ගැනීමට හරාම් (වැලැක්වූ) මාර්ගය තෝරා ගන්නේ ඇයි?

## තුන්වන වාදය මොලොවට වඩා එලොව උතුම්ය

සත්‍යය නම් මෙලොවට වඩා ආඛිරතය (එලොව) උතුම්ය. මෙසේ වාද කරද්දී ඉතාමත් කණගාටුයි ඔවුන්ගේ හැසිරීම නම් මෙලොව උතුම් යන්න හැඟෙන බවයි. ඔවුන්ගේ එකම චේතනාව මෙලොව ඇති වස්තූන් එකතු කිරීමයි. සෑම කෙනෙකුට ම මෙලොව ඇති වස්තූන්ට ලැදි කමක් තිබෙන නමුත් මෙලොවින් සමුගැනීමක් ඇති බවක් ඔවුන්ට හැඟෙන්නේ නැතිවාසේය.

## සිව් වන වාදය එක් දිනක අනිවාර්යයෙන්ම මැරෙන්න සිදු වෙයි

එයත් සත්‍යයි, අපිට එක් දිනක මරණයක් එයි. මෙය ඉතාමත් කණගාටුවෙන් හෝ පිළිගත යුතුයි. තවද ඔවුන් හැසිරෙන්නේ කවදාවත් මරණයක් සිදු නොවන්නාසේය. සෙයිදුනා හසනුල් බසරි رضي الله تعالى عنه තුමානන් “අපි එක් දිනක මැරෙන්නෙමු” යන වාදයට පාඩමක් දෙන ජීව රූපයකි. එතුමාණන්ගේ ජීවන හැසිරීම නම් සෑම වෙලේම බියෙන් පසු වූහ. හරියට එතුමාණන්ට මරණ දඬුවම නියම කර ඇතිසේය. (ඉහ්යාඋල් උලූම් 4වැනි කොටස, පිටුව 198 දාරුල් කුතුබුල් ඉල්මියා බේරූත්). එයට මේ කාලයේ “බ්ලේක් වරන්ට්” යැයි කියති. නමුත් හැම

උපදින කෙනාටම මැරෙන්න සිදු වන බවට වරෙන්තු නිකුත් වී ඇත. සෑම ජීවිතයක්ම උපදින්නට පෙරම “හෙට් ලිස්ට්” එකට පැමිණ ඇත. එනම් ඔහු ඉපදීමට පෙර ඔහුගේ ආහාර පාන, වාසය, භූමදානය කරන තැන තීන්දු වී හමාරය. මවගේ ගර්භාෂයේ මිනිසාව මැවීම සඳහා මලාඉකාවරු පස් රැගෙන එන්නේ ද මෙම මිනිසා වාසය කර මිය යෑමෙන් පසු වළදාන තැනින්මය. අසව්! අසව්! මිනිසා තමන්ගේ ආහාර පංගුව අනුභව කර ජීවත් වීමෙන් පසු මිනිසුන්ගේ උරහිස් මත සුන්දූකයේ (මිනී පෙට්ටියේ) ගමන් කරමින් කබ්ර්ස්ථානය (සොහොන් භූමිය) වෙත යන විට ඔහු පවසන්නේ කුමක්ද? එම නිසා.......

## 12. ජනාසාවේ දැනුම් දීම

මදීනාවේ ජනනායක, සමීම්පතම සුල්තාන්, හිතට සැනසීමක් දෙන්නා වූද උදව් කරන්නාගේ මාර්ගෝපදේශක صلى الله تعالى عليه واله وسلم තුමාණන් මෙසේ වදාළහ. කිසි ගේ ග්‍රහනය මත මාගේ ප්‍රාණය ඇත් ද ඔහුගේ නාමයෙන් දිව්රා කියමි. මිනිසුන් මැරුණු කෙනාගේ තැන් දුටුවේ නම් තවද ඔහුගේ කථාවට ඇහුම්කන් දුන්නේ නම් මැරුණු කෙනාව අමතක කර තමන් වෙනුවෙන් ඇඬීමට පටන් ගනිති. මෘත දේහය සුන්දූකයේ (මිනීපෙට්ටිය) තබා ගෙන යන විට ඔහුගේ ප්‍රාණය ඒ මත වාඩි වී අඬ ගසයි. මාගේ නෑදෑයනි! ලෝකය මා සමඟ සෙල්ලම් කළා සේ ඔබ සමගත් සෙල්ලම් කිරීමට ඉඩ නොතබන්න. මට හරාම්, හලාල් මුදල් සියල්ල එකතු කර එය අනුන් වෙනුවෙන් ඉතිරි කර

එන්නට සිදු විය. එහි ප්‍රයෝජනය ඔවුන්ටයි. එහි විපාකය මා හටයි. මා හට සිදු වූ දෙයින් ඔබත් පාඩමක් ගන්න.

(අත්තස්කිරතු කුර්තුබී පිටුව 76දාරුල් කුතුබුල් ඉල්මීයා බේරුත්)

මාගේ හිතාදර මුස්ලිම් සහෝදරවරුණි! සිතිය යුතු දෙයක්! ඇත්තටම සියළු ජනසාවන් (මෘත දේහයන්) නියම මුබල්ලිග් (ප්‍රචාරය කරන්නා) වේ. තවද මෙහි අඬගසා කියන්නේ අද මට සිදු වූ දෙය හෙට ඔබටත් සිදු විය හැකිය යන්නයි. එනම් ඔහුගේ පිටු පසින් අපිටත් යන්නට සිදු වන බවයි. එසේ නම් ජනසාවක් අපගේ මාර්ගෝපදේශකයාය.

ජනාසාව ඉදිරියට පැමිණ පවසන්නේ ලෝවැසියනි! මාගේ පිටුපසින් පැමිණෙන්න මා ඔබගේ මාර්ගෝපදේශකයාය.

## 13. කබ්ර් වාසීන් සමඟ සාකච්ජාවක්

ෂර්හුස්සුදූර් නමැති ග්‍රන්ථයේ හසරත් සෛයිදුනා සර්ද් ඉබ්නු මුසයියබ් رضي الله تعالى عنه තුමාණන් පවසන්නේ එක් වරක් අපි හසරත් සෛයදුනා අලියුල් මුර්තලා ෂේරේහුදා كَرَّمَ اللّٰهُ تَعَالٰى وَجْهَهُ الْكَرِيْم සමඟ මදීනා මුනව්වරා කබ්ර්ස්ථානය (සොහොන් භූමිය) ට ගියෙමු. හසරත් මෞලා අලි كَرَّمَ اللّٰهُ تَعَالٰى وَجْهَهُ الْكَرِيْم තුමාණන් කබ්රාවසීන්ට සලාම් පවසා ඉන් පසු කබ්ර්වැසියනි! ඔබ ඔබලාගේ විස්තර කියනවාද? නැතහොත් මා කියන්නද? විමසූහ. සෛයිදුනා සර්ද් බින් මුසයිබ් رضي الله تعالى عنه තුමාණන් පවසන්නේ අපි කබ්ර්ස්ථාන

වලින් (සොහොන් බිමෙන්) "وَعَلَيْكَ السَّلَامُ وَرَحْمَةُ اللّٰهِ وَبَرَكَاتُهُ" නැගෙන ශබ්දය ඇසුවෙමු. ඒ සමඟ එක් කබ්රයකින් මෙසේ කියන්නට විය. යා අමීරුල් මුඃමිනීන් ඔබ තුමාට පවසන්නැයි අපේ මරණයෙන් සිදු වූයේ කුමක්ද? කියා ඉන්පසු හසරත් මෞලා අලි كَرَّمَ اللّٰهُ تَعَالَى وَجْهَهُ الْكَرِيْم තුමාණන් මෙසේ පැවසූහ. අසනු! ඔබලාගේ මුදල් බෙදා දෙන ලදි. ඔබලාගේ වැන්දඹුවන්, දෙවැනි කසාදයක් බැඳ ගත්හ. ඔබලාගේ දරුවන් අනාථ විය. ඔබලා ශක්තිමත්ව තැනූ ගෙවල් වල ඔබලාගේ සතුරන් පදිංචි විය. දැන් ඔබලාගේ විස්තර කියන්න. මෙය ඇසෙත්ම කබ්රයෙන් ශබ්දයක් ඇසෙන්නට විය. යා අමීරුල් මුංමිනීන්! අපේ කෆන් කැබලි කැබලි විය. අපේ කෙස් ගැලවී විසිරී ඇත. අපේ සම ගැලවී ඇත. අපේ කම්මුල් ගැලවී එල්ලෙමින් තිබේ. අපි කළ දේවල්වලට අපට දඬුවම් ලැබෙමින් තිබේ. ඉතිරි කර පැමිණි දෙයින් අපිට පාඩු සිදු විය. (ෂර්හු ස්සදූර් පිටුව 209 දාරුල් කුතුබුල් ඉල්මියා බේරූත්) මා හිතාදර ඉස්ලාමීය සහෝදරවරුණි! අවසානයේ අත හැර ගියේ කුමක්ද? ඒ ගැන මිනිසා සිතිය යුතුයි. නරක ජාවාරම් වැරදි වැඩට ආයුධ සැපයීම් වැනි දේවල් ඉතිරි කර මැරුණු පසු පරම්පරාවන් එය පිළිපදී නම් එහි අවසානය ඉතාමත් බේදනීය වේ. එක් බිය උපදවන වාක්‍යක් අසන්න.

## 14. රූපවාහිනී යන්ත්‍ර (Televison) තබා යෑමෙන් මැරුණු කෙනාට කබ්රයේ අසාබ් (දඬුවම්)

මුස්ලිම් සහෝදරයෙක් ලිඛිතව යැවූ මෙහි සාරාංශය මාගේ වචන වලින් පැවසීමට උත්සාහ කරමි. සින්ද පළාතේ ඇතුළත වාසය කරන උතුමෙක් මෙසේ

පැවසුවේය. දිනක් මම කබ්රස්ථානයේ එක් අළුත් සොහොනක් ළඟ වාඩි වුණෙමි. එයින් පාඩමක් ලබා ගැනීම සඳහා ඉඳගෙන සිටින විට මටත් නොදැනී නිදිමත හැදිනි. එවිට මට කබ්රය තුළ සියල්ල දර්ශනය විය. මට දකින්නට ලැබුණේ කමක්ද? කබ්රය තුළ සිටින්නා ගින්නෙන් වෙලී ගෙන මොර දෙමින් මාව බේර ගන්න යැයි කියා සිටියේය. එවිට මා කෙසේ ඔබව බේරාගන්නේ? ඇසුවෙමි. “එවිට ඔහු” ටික දිනකට පෙර මගේ මරණය සිදු විය. මගේ තරුණ පුතා මේ වෙලාවේ රූපවාහිනී (T.V) යන්ත්‍රයෙන් චිත්‍රපටයක් බලමින් සිටියි. ඔහු එසේ කරන සියළු අවස්ථාවන්වල මම දරුණු දඬුමට ලක් වෙමි. අල්ලාහ් عَزَّ وَجَلَّ ගේ නාමයෙන් මාගේ තරුණ පුතාට පහදන්න. විහිළුවෙන් හා විනෝදයෙන් කාළය නාස්ති කිරීමෙන් වළක්වන්න. ඔහුව රූපවාහිනී (T.V) බැලීමෙන් වළක්වන්න. එය මා විසින් ගෙන දුන්නා. ඒ නිසාම මා දඬුවමට ලක් වන්නෙමි.

කණගාටුයි, මම ඔහුගේ ලෞකික දේවල් ඉගැන්නුවත් ආගමික දේ ඉගැන්නුවේ නැත. ඔහුව නරක දේවල් වලින් නැවැත්වූයේ ද නැත. කබ්රය හා කියාමතය ගැන පහදා දුන්නේ ද නැත. කබ්රයේ සිටි තැනැත්තා තමාගේ නම හා ලිපිනයද මට ලබා දුන්නා. එය රැගෙන මම පාන්දරින්ම ළඟම ඇති ගමේ ඔහුගේ නිවසට ගියෙමි. ඔහුගේ තරුණ පුතාද රෑ (T.V) බැලූ බව පිළිගත්තේය. මම ඔහුට මගේ හීනය ගැන පැවසූ විට වේදනාවට පත්ව අඬාගෙන තම ගෙදරින් (T.V) එක ඉවත් කළේය.

## 15. රූපවාහිනී යන්ත්‍ර (Televison) ඉවත් කිරීමෙන් නබි නායක صَلَّى اللّٰهُ تَعَالٰى عَلَيْهِ وَاٰلِهٖ وَسَلَّم ගෙන් සුභ පැතුම්

මෙයත් එක්තරා මේජර් වරයෙකුගේ කථාවයි. මම ඒ දවස්වල "මංගලා ඩෑම්" එකේ සිටියෙමි. දීනාහ් (ජෙහ්ලම්වල) ඉස්ලාමීය සහෝදරවරුන් සුන්නතයන්ගෙන් පිරුණු කැසට් පටයක් තෑගි වශයෙන් දුන්හ. ඒවා නිවසේදී දමා අසාගෙන සිටියෙමි. එහි ගීත වල උතුමාණන් වාක්‍යයක් තිබුණි. එය අසා අපි සියළු දෙනාම අල්ලාහ් عَزَّوَجَلَّ ගේ අzසාබයට (දඬුවමට) බය වී එකමතිකව රූපවාහිනී යන්ත්‍ර (Television) ඉවත් කළෙමු. සතියකින් පසු මගේ දරුවාගේ මව මදනි අකා صَلَّى اللّٰهُ تَعَالٰى عَلَيْهِ وَاٰلِهٖ وَسَلَّم තුමාණන්ව දුටුවාය. තව ද මගේ ප්‍රියාදර මදීනාවේ මුස්තෆා صَلَّى اللّٰهُ تَعَالٰى عَلَيْهِ وَاٰلِهٖ وَسَلَّم තුමාණන් මෙසේ පැවසූහ. සුභ පැතුම් (මුබාරක්) ඔබ ඔබේ නිවසින් රූපවාහිනී යන්ත්‍රය (Television) ඉවත් කිරීමේ කාර්‍යයට අල්ලාහ් عَزَّوَجَلَّ ද එකඟ විය. ඔබද රූපවාහිනී යන්ත්‍ර (T.V) හා VCD අත්හරින්න. එසේ කර රසූල් صَلَّى اللّٰهُ تَعَالٰى عَلَيْهِ وَاٰلِهٖ وَسَلَّم තුමාව සතුටු කරන්න.

## 16. කපටිකම් හා රැවටීම් නොකරන්න

මා හිතාදර ඉස්ලාමීය සහෝදරවරුණි! දැන් බලමු භාග්‍යවන්තයා කවුද? කියා, තවද මෙයද බැලිය හැක. මෙම කර්මය රූපවාහිනී යන්ත්‍රය (Television) නිවසේ තබා මැරෙන්නේ කවුරුන්ද කිය එසේ T.V තබා ගෙන මැරෙන්නා අල්ලාහ් عَزَّوَجَلَّ නොකරත්වා. අල්ලාහ් عَزَّوَجَلَّ නොකරත්වා කබ්ර්වලදී හිර වීමට සිදු විය හැක. සමහර

විට ෂෛතාන් ඔබට සැක ඇති කළ හැක. දෑවතේ ඉස්ලම් වරුන් මෙම වාක්‍යයන් කොහෙන් රැගෙන ආවාද දන්නෙ නැහැ. එසේ නම් සමහරක් ගෙවල් වලත් T.V තිබෙන්නේ යැයි සිතිය හැක. බලන්න මාව සෑහීමට පත් කිරීමට මෙය ප්‍රමාණවත් නැත. ඔබ මා හට (Television) වල ඇති ප්‍රයෝජනයන් කියන්න සිදු වෙයි. උදාඃ- ලැජ්ජා නැති ස්ත්‍රීන් T.V වල නටන විට බැලුවහොත් (සවාබ්) මෙපමණ පින් ලැබෙයි? එසේම ෆර්දා (ඉස්ලාමීය ඇඳුම්) නොමැති ප්‍රවෘත්ති ප්‍රකාශිකාවන් බැලීමෙන් මෙපමණ (සවාබ්) පින් ලැබේ? තවද Music ඇසීමෙන් නැටුම් බැලීම යනාදීන්ගේ ප්‍රයෝජනයන් පැවසිය යුතුයි. සත්‍ය වශයෙන්ම ඔබ කවදාවත් එහි ප්‍රයෝජනය පුණ්‍යතාවය කිව නොහැක. ඔබ මා විසින් පැවසූ දේ පිළිගත්තත් නොගත්තත් අල්ලාහ්ට عَزَّ وَجَلَّ බිය වන්නාගේ සිත තුළ T.V පව් වල මීටරය වේගයෙන් දුවවයි කියා දෝංකාර දෙමින් තිබේ. මෙය සමාජයම නරක් කළා. නාස්ති කළා, හොඳ ගතිගුණ නැති කළා. ලැජ්ජාශීලී බව නැති කළා, රූපවාහිනී යන්ත්‍ර (Television) හේතුවෙන් මේවා වැඩි වූවා මිස අඩු වුණේ නැත. තවද අඩු නාලිකාවන් ඩිෂ් ඇන්ටනා භාවිතයෙන් සම්පූර්ණ කළා. T.V අපේ ගෙවල්වල දූවරුන් ලේලියන්ට අළුත් fashion මෝස්තර ඉගෙන්නුවා. අපගේ තරුණ පුතුන්ට ප්‍රේම කථාවන් කියා දී කෙල්ලන්ගෙ ප්‍රේම කථා කියා දී කෙල්ලන්ගේ ප්‍රේම දැල්වල සිර කළා. එම කුමන්ත්‍රණයේ අපේ දූවරුන් හා ලේලියන් අසු වුණා. පුංචි පුංචි දරුවන් ගෙන බැලුවහොත් සංගීතයට අනුව පාදයන් තබ තබා නටන අයුරු දක්නට ලැබේ. තවද ඒවා

දැන් ඉන්ටර්නෙට් වලින් සම්පූර්ණ විය. මුස්ලිම්වරුන් විනාශ විය. කාෆිර් ශක්තියෙන් අපව එළවමින් සිටියි. ඔවුන්ගේ ආස්වාදයට හා විනෝදයට ඇබ්බැහි වී දැන් මුස්ලිම්වරුන් කාෆිර්වරුන්ට අත පාන්නට සිදු වී ඇත. කාලයක් තිබුණා මුස්ලිම්වරුන් 313 දෙනෙක් බද්ර් රණ බිමේ කාෆිර් වරුන්ගේ දාහක් (1000) බල ඇණිය පරාජය කළහ. ඔවුන්ගේ ඊමානය මෙයයි.

මාගේ හිතාදර ඉස්ලාමීය සහෝදරවරුණි! තම තමන්ගේ පව් වලට තව්බා කර ගන්න (පාපොච්චාරණය) කර ගන්න. ඒ සමගම මින් පසු නරක වැඩ නොකිරීමටත් හොඳ දේවල් කිරීමටත් අදිටන් කර ගන්න. එන්න නරක වැඩ වලට ලැබෙන අඩුවම් ගැන අසන්න. ඉන්ෂා අල්ලාහ් عَزَّوَجَلَّ එයින්ම අල්ලාහ් عَزَّوَجَلَّ ගැන බිය ඇති වේ. තව්බා කිරීමට සිත පෙළඹේ.

## 17. භයංකර ප්‍රපාතය

නරකාදියේ ගයි නම් ප්‍රපාතයක් තිබේ. එහි උෂ්ණයෙන් බේරීමට අනෙකුත් ප්‍රපාතයන් ආරක්ෂාව පතයි. මෙම ප්‍රපාතය මත් ද්‍රව්‍ය බොන්නන්, පොළී කාරයන්, බොරු සාක්ෂි කාරයන් දෙමාපියන්ට අවනත නොවන්නන් හා සලාතය නොයෙදෙන්නන්ටයි. (රූහුල් බයාන් 5වැනි කොටස 34වැනි පිටුව දාර් අහ්යා අත්තරාසුල් අරබි බේරූත්)

## 18. මුඩු හිස (පැතලි ඔලු) නාග රාජයා

හසරත් සෛයිදුනා අබූ හුරෛරා رضی اللہ تعالیٰ عنہ

තුමාණන් රිවායත් කරති. උත්තම නබි නායක صلى الله تعالى عليه واله وسلم තුමාණන් මෙසේ වාදාළහ. අල්ලාහ් عزوجل යම් කිසි කෙනෙකුට මිල මුදල් ලබා දී තිබියදීත් ඔහු එයින් සකාත් නොදුන්නහොත් කියාමත් දිනයේ දී ඔහුගේ මුදල් මුඩු හිස (පැතලි ඔලු) නාග රූපයක් ලෙස සාදනු ලැබේ. තවද එම නාග රාජයාව ඔහුගේ ගෙලේ මාලයක් ලෙස දමනු ලැබේ. එවිට එම නාග රාජයා හපා ගෙන මෙසේ කියයි. මමයි ඔබේ මුදල්, මමයි ඔබේ වස්තුන්, (සහීහ් බුහාරි හදීස් නො: 1403 වැනි කොටස පිටුව 474 දරුල් කුතුබුල් ඉල්මියා බේරුත්)

## 19. දවස් 40ක් වන තෙක් සලායතයන් පිළි නොගැනේ

මෙය මත් පැන් බොන්නන්, හෙරොයින් (Drugs) භාවිත කරන්නන්, zසිනා (ගණිකාවන් වෙත යන්නන්) සූදු කෙළින්නන් යනාදී ක්‍රියාවන්වල යෙදෙන්නන් හට සිතීමට නිමේශයයි.

හසරත් සෛයද්දුනා අබ්දුල්ලාහ් බින් උමර් رضی اللہ تعالیٰ عنہما තුමානන් රිවායත් කරන්නේ රසුල් صلى الله تعالى عليه واله وسلم තුමාණන් මෙසේ පැවසූහ. මත්පැන් (මත්ද්‍රව්‍ය) භාවිත කරන්නන්ට දවස් 40ක් වනතෙක් ඔවුන්ගේ සලාතයන් පිළි නොගැනේ. එවිට ඔහු තව්බා (පාපොච්චාරණය) කළහොත් ඔහුගේ තව්බා පිළිගනු ලැබේ. නැවතත් ඔහු බීව් දවස් 40වන තෙක් සලාතයන් පිළි නොගැනේ. එවිට ඔහුගේ තව්බා (පාපොච්චාරණය) පිළිගනු ලැබේ. තුන්වන වතාවටත් ඔහු බිව්වොත් දවස් 40වන තෙක් සලාතයන් පිළි නොගැනේ. එවිට

ඔහු තව්බා (පාපොච්චාරණය) පිළිගනු ලැබේ. සිව්වැනි වතාවටත් ඔහු මත්ද්‍රව්‍ය භාවිත කළ හොත් ඔහුගේ සලායතය දවස් 40වන තෙක් පිළි නොගැනේ. ඉන් පසු ඔහු තව්බා කළත් එය පිළිගනු නොලැබේ. තවද කියාමත් දිනයේ දී නිරයේ සිටින්නන්ගේ පීප්ප පොවනු ලැබේ. (ජාමිඋත්තිර්මිදී හදීස් 1869 3 වැනි කොටස පිටුව 341 දාරුල් ෆික්ර් බේරුත්)

## 20. ෂේරේ හුදා (දෙවියන්ගේ සිංහයා) තුමානන්ගේ මත් පැන් පිළිකුල

හසරත් අමීරුල් මුඃමිනීන් සෛයිදුනා අලීයුල් මුර්තලා ෂේරෙ හුදා كَرَّمَ اللّٰهُ تَعَالٰى وَجْهَهُ الْكَرِيْم මත් පැන් පිළිකුල් බව අඟවද්දී පවසන්නේ ළිඳක මත්පැන් බිංදුවක් හරි වැටුනොත් ඉන්පසු එහි මනාරයක් (අසාන් කියන උස තැන්) තැනුවත් මම එහි අසාන් (බාංගු) නොකියමි. එසේම ගඟක මත්පැන් බිංදුවක් වැටුනොත් ඉන්පසු එම ගඟ වියළී ගියත් එහි තණ කොළ වැඩුනොත් මාගේ සිව්පාවුන්ට කෑමට නොදෙන්නෙමි. (රූහුල් බයාන් 1වැනි කොටස පිටුව 340දාර් ඉහ්යාඅත්තරාසුල් අරාබි බේරුත්)

## 21. දුෂ්ට දෙමව්පියන්ටත් අවනත වීම

දෙමව්පියන්ට අකීකරුව හැසිරෙන්නන් බය වී තව්බා (පාප්පොච්චාරණය) කර ගන්නා අතර දෙමව්පියන්ගේ ද සමාව ගෙන ඔවුන්වත් සතුටු කළ යුතුයි. හසරත් සෛයිදුනා අබ්දුල්ලා ඉබ්නු අබ්බාස් رضی اللہ تعالیٰ عنہما පවසන්නේ සර්කාරේ නාමදාර් මක්කා, මදීන

රජුද අල්ලාහ් عَزَّوَجَلَّ ගේ ප්‍රියාදර වුද صَلَّى اللّٰهُ تَعَالٰى عَلَيْهِ وَاٰلِهٖ وَسَلَّم තුමාණන් මෙසේ වදාළහ. යම් කිසි කෙනෙක් තම දෙමව්පියන්ට කීකරු වී ද ඔහු වෙනුවෙන් ජන්නතයේ (ස්වර්ගයේ) දොරවල් දෙකක් විවෘත වේ. දෙමව්පියන්ගේ කෙනෙක් ජීවතුන් අතර සිටීද ඔහු එම එක්කෙනාට කීකරු වීද ඔහු වෙනුවෙන් එක් දොරක් විවෘත වේ. යම් කිසිවෙක් දෙමව්පියන්ට කීකරු (අවනත නොවී) වී සිටීද ඔහු වෙනුවෙන් ජගන්නම් වල (නිරයේ) දොරවල් දෙකක් විවෘත වෙයි. එසේම කෙනෙකුට දෙමව්පියන්ගේ කෙනෙකු සිටී නම් ඔහු ඔවුන්ට අකීකරු වීද ඔහු වෙනුවෙන් ජහන්නම් වල (නිරයේ) එක් දොරක් විවෘත වෙයි. මෙය අසා එක් සහාබි වරයෙක් මෙසේ ප්‍රශ්ණ කළහ. ඔහුගේ දෙමව්පියන් දුෂ්ට නම්? එවිට صَلَّى اللّٰهُ تَعَالٰى عَلَيْهِ وَاٰلِهٖ وَسَلَّم තුමාණන් මෙසේ පැවසූහ. ඔහුගේ දෙමව්පියන් ඔහුට හිංසා කළත් ??????

(ෂුːබුල් ඊමාන් හදීස් 7916 වැනි කොටස පිටුව 206 දාරුල් කුතුබුල් ඉල්මීයා බේරුත්)

## 22. පොරොන්දු කඩ කරන්නාගේ විනාශය

මාගේ හිතාදර ඉස්ලාමීය සහෝදරවරුණි! ඔබගේ දෙමව්පියන් ඔබට ෂරීඅතයට විරුද්ධ දෙයක් කිරීමට අණ කළහොත් ඔවුන්ට කීකරු නොවන්න. උදාː- හරාම් වූ ආකාරයට හම්බ කිරීම, රැව්ල බෑමට අණකලහොත් අවනත නොවන්න. නරක (පව්) වැඩ වලට දෙමව්පියන්ගේ අණට කීකරු වී කළහොත් ඔහුට ජහන්නම් (නිරය) වලට යෑමට සිදු වෙයි. එසේ යම්

කිසිවෙක් පොරොන්දු වීමෙන් පසු (ෂරීඅතයට විරුද්ධ නොමැති නම්) ඉටු නොකරන්නන් සිතිය යුතුයි කුමක් කළ යුතු ද කියා.

අමීරුල් මුඃමිනීන් හසරත් සෛයිදුනා අලීයුල් මුර්තලා كَرَّمَ اللّٰهُ تَعَالٰى وَجْهَهُ الْكَرِيْم තුමාණන් මෙසේ රිවායත් කරති. මක්කා, මදීනා උරුමක්කාර සුල්තාන් දෙලොවෙහි සර්කාර් صَلَّى اللّٰهُ تَعَالٰى عَلَيْهِ وَاٰلِهٖ وَسَلَّم තුමාණන්ගේ මෙම පැවසීම බිය උපදවන දෙයකි. කිසි කෙනෙක් මුස්ලිම්වරයෙකුට පොරොන්දු කඩ කළහොත් ඔහුට අල්ලාහ් عَزَّ وَجَلَّ තම මාලාඉකාවරුන් හා සියළු ජනතාවගේ ලඃනතය (ශාපය) ලැබෙන අතර තවද ඔහුගේ කුමණ ෆර්ල් හෝ වේවා, නෆ්ල් හෝ වේවා පිළි නොගැනේ. (බුහාරි ෂරීෆ් හදීස් 1870 1වැනි කොටස පිටු 616 දාරුල් කුතුබුල් ඉල්මීය බේරුත්)

## 23. උදරයේ පණුවන්

හසරත් සෛයිදුනා අබු හුරෛරා رَضِىَ اللّٰهُ تَعَالٰى عَنْه තුමාණන්ගේ රිවායයෙක් නම් මදීනා මුනව්වරාවේ බලධාරී මක්කා මුකර්රමාවේ නායක صَلَّى اللّٰهُ تَعَالٰى عَلَيْهِ وَاٰلِهٖ وَسَلَّم තුමාණන් මෙසේ පැවසූහ. මිහ්රාජ් රාත්‍රියේ මාව එක් කණ්ඩායමක් ළඟින් එක්ක ගියා. ඔවුන්ගේ උදරයේ පණුවන් පිරී තිබිණි. එය උදරය තුළින් පැහැදිලිව පෙනෙන්නට තිබිණි. මා ජිබ්රිල් අලෛහිස්සලාම් ගෙන් ප්‍රශ්න කළා. මේ කට්ටිය කවුද? එයට මලාඉකාරවරයා මෙසේ පිළිතුරු දීය. “මේ පොළී කන්නන්ය” (සුනනිබ්නු මාජා හදීස් 2273 3වැනි කොටස පිටුව 71දාරුල් මඃරිෆා

බේරුත්)

## 24. 36වරක් zසිනා කිරීමටත් වඩා අන්තයි

හසරත් සෛයිදුනා අබ්දුල්ලා බින් හන්ලලා رضی اللہ تعالٰی عنہ තුමාණන් රිවායත් කරති. අල්ලාහ් عَزَّوَجَلَّ ගේ ප්‍රියාදර වූද, සියළු රහස් දන්නා වූ ද මුනස්සහු අනිල් උයුබ් صَلَّی اللہ تعالٰی علیہ واٰلہٖ وسلم තුමාණන් මෙසේ පැවසූහ. පොළියෙන් හම්බ කරපු දිර්හමයක් දැන ගෙන කෑවොත් (ප්‍රයෝජනයට ගත හොත්) 36 වතාවක් සිzනා කිරීමට වඩා අමාරු ලොකු පවකි. (සුනන් දාර් කුත්නි හදීස් 2819 3 වැනි කොටස පිටුව 19)

## 25. නිරයේ තෝෂා (උදේ ආහාරයක්)

හසරත් සෛයිදුනා අබ්දුල්ලාහ් ඉබ්නු මස්ඌද් رضی اللہ تعالٰی عنہ තුමාණන් විසින් රිවායත් නම් හරාම් මුදල් හම්බ කර එය වියදම් කිරීමෙන් එහි බරකත් නැත. තවද සදකා කෙරුවත් එය පිළි නොගැනේ. තවද ඔහු මරණයට පත්වන විට ඉතිරි කරගෙන තිබුණත් එය ඔහුට නිරයේ තෝෂා (උදේ ආහාරයක්) වෙයි. (මුස්නද් ඉමාඃ අහ්මද් හදීස් 3672 20 වැනි කොටස පිටුව 34 දාරුල් ෆික්ර් බේරුත්)

## 26. මදනි උසුල් (නීති රීති) හත

මාගේ හිතාදර ඉස්ලාමීය සහෝදරවරුණි! නැගිටින්න! කම්මැලිකම් වලින් මිදී අවදි වන්න. ඉක්මන් කර පව් වලට තව්බා කර ගන්න! පරංගි

චාරිත්‍ර වලින් මිදින්න! හිතාදර ප්‍රියාදර මදීනා නායක මුස්තෆා صَلَّى اللّٰهُ تَعَالٰى عَلَيْهِ وَاٰلِهٖ وَسَلَّم තුමාණන්ගේ හොඳ හොඳ සුන්නතයන්ට පුරුදු වන්න. තමන් ද ශීලාචාර වී අනුන්වත් ශීලාචාරවත් කරන්න. දෑවත් (හොඳ දෙයකට අඬ ගැසීම) සඳහා පණ දීමටත් සූදානම් වන්න! ජීවිතය, මිළ මුදල් සියල්ල සුන්නතයන් නගා සිටුවීමට, කුර්බාන් කිරීමට පෙළඹෙන්න. තවද නියියත් කරන්න. (ان شـآء الله عَـزَّوَجَـلَّ) මගේ හා සියළු ලෝවැසියන්ගේ වැරදි නිදොස් කිරීමේ උත්සහය සඳහා මදනි ඉනාමත් වලට (වැඩ කර) සියළු ලෝවැසියන්ව ශිලාචාර කිරීම සඳහා මදනි කාෆිලාවල ගමන් කරන්න. මේ මදනි වැඩවල් ටික කර ගැනීමට මම ඔබේ ප්‍රාණය මෙන් මදනි උසුල් (රීති) ටික පිළිපදින්න.

1 හැම සලාතයම ජමාතය සමඟ ඉටු කරමි! තවද ඒ සඳහා සෑම සලාතයේ අඩුම තරමින් කෙනෙක්වත් දෑවත් (අඬ ගසා) තමන් සමඟ මස්ජිදයට රැගෙන ඒමට උත්සාහ කරන්න.

2. දිනපතා අඩුම තරමින් පැය 2ක් දෑවතේ ඉස්ලාම් මේ මදනි කාම් (වැඩ) වලට යෙදෙමි.

3. සතියේ වතාවක් ප්‍රදේශයේ සැරි සැරීම නේකීකි දෑවත් (හොඳක් කිරීමට අඬ ගැසීම) ආරම්භයේ සිට අවසානය දක්වා සහභාගී වීම

4. සතිපතා ඉජ්තිමාවල නොවරදවා ආරම්භයේ සිට අවසානය දක්වා සහභාගී වීම.

5. දිනපතා මදනි ඉනාමාත් කාඩ් පිරවීම හා මාසයේ පළමු දවස් 10 ඇතුළත අදාල බලධාරියාට භාර

දීම.

6. ජීවිතයේ එක් වතාවක් මාස දොළහක්, සෑම 12වැනි මාසයෙන් දවස් 30ක් හා සෑම මාසයෙන් දවස් 3ක් මදනි කාෆිලාවල යෑම.

7. තනි තනියේ උත්සාහ කර මුස්ලිම් සහෝදරයන්ව මදනි මා හවුන් වලට රැගෙන ඒම

## සවාබුල් ජාරියා (සදකතුල්ජාරියා) (දිගටම ලැබෙන කුසල්)

මෙම පොත් පිංච කියවීමෙන් පසු අනුන්ටත් දී උදව් වෙන්න. තවද මීලාද් උත්සව වලත්, අව්ලියාවරුන්ගේ දානයන් (කන්දූරි) වලත්, මංගල්‍යය උත්සව වලදීත්, කතමුල් කුර්ආන් තමාම් කරන අවස්ථාවලත්, තවද ආගමික උත්සව වලදීදීත්, මළවුන්ට පින් ලබාදීම පිණිසත්, තවද අමාරු දුෂ්කර අවස්ථාවලින් මිදීමත් මෙම පොත මක්තබතුල් මදීනාවෙන් මිළදීගෙන අධික ලෙස පින් (කුසල්) ලබා ගන්න.

**මෙම පොත භාෂා ගණනාවකින් www.dawateislami.net වෙබ් අඩවියේ පළ කර ඇති අතර අවශ්‍ය භාෂාවකින් කියවීමට ඒ වෙත යොමුවන්න.**

٧٨٦
قفل مدینہ
٩٢

الصلوة والسلام عليك يارسول الله

# සුන්නතයන් හි වසන්තයන්

අල්හම්දුලිල්ලාහ් අල්කුර්ආනය හා සුන්නතයන් උගන්වන අහ්ලුස් සුන්නත්වල් ජමාඅතයේ දේශපාලනයෙන් තොර ලෝක සංවිධානයක් වන දෑවතේ ඉස්ලාමියේ සුවඳවත් මදනි වට පිටාව තුල වැඩි වශයෙන් සුන්නකයන් ඉගෙනීමටත් ඉගැන්වීමත් සිදු කරනු ලැබේ. සෑම බ්‍රහස්පතින්දා සවස මඃරිබ් සලාතයේ සිට නො. 10 මැසෙන්ජර් වීදියේ කොළඹ 12 යන ලිපිනයේ සිදු වන සුන්නත් වලින් පිරිණු ඉජ්තිමාවේ ආරම්භයේ සිට අවසානය දක්වා සහභාගි වි වැඩ වැඩියෙන් පින් (කුසල්) රැස්කර ගන්න.

තවද රසූල් තුමානන් ගේ ස්නේහවන්තයන් සමග සුන්නතකයන් ඉගෙන ගැනීමට මදනි කාෆිලාවල ගමන් කරන්න. ඔබ ශීලාචාර මුස්ලිම්වරු (හොඳ පුරවැසියන්) වීමට මක්තබතුල් මදීනා එනම් දෑවතේ ඉස්ලාම් පොත් හලකින් මදනි ඉන් ආ මාත් කාඩ් පතක් සෑම ඉස්ලාම් මාස ආරම්භයේදීම ලබාගෙන එහි ඇති පරිදි ක්‍රියා කර (අමල් කර) දිනපතා ෆික්රේ මදීනා (තම ක්‍රියාවන් අධීක්ෂණ) කරමින් එය පුරවා සෑම ඉස්ලාමීය මාසයේ අවසානයේදී ඔබේ ප්‍රදේශයේ දෑවතේ ඉස්ලාම් බලධාරියාට එය භාර දෙන්න. ඉන්ෂා අල්ලාහ් මෙහි බරකතයෙන් ෆර්ල් වාජිබ් හා සුන්නතයන් නිසියාකාරව පිළිපැදීමටත් පාප ක්‍රියාවන් වලින් ඈත් වී ඊමානය ආරක්ෂා කර ස්ථිර තත්වයකට පැමිනීමක් දැකිය හැක.

සෑම ඉස්ලාමීය සහෝදරවරුන් තම තමාවත් සියලු ලෝවැසියන් යහමගට ගැනීමට උත්සාහ දරමි (කරමි) ඉන්ෂා අල්ලාහ් යන මදනි (යහ) අරමුණ (මතය) තම අරමුණ කර ගත යුතුයි. තමන් ශිලාචාර (යහමගට පැමිනීම) වීමට මදනි ඉන්ආමාත් අනුව ක්‍රියා (අමල්) කරන අතර ලෝ වැසියන් (ලෝකයේ ජනතාව) ශිලාචාර කිරීමට මදනි කාෆිලාවේ ගමන් කිරීමෙන් ඉහත සඳහන් මදනි අරමුණ ඉටුකර ගත හැකිය.